**රජයේ මූල්‍ය ප්‍රකාශන - 2019**

**-------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

2019 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍යකාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සටහන්වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ රජයේ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 15 වගන්තිය ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩනවාර්තාව 2020 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020නොවැම්බර් 12 දිනප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම රජයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහමුදල් ප්‍රවාහපොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර

ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරවමුදල් අමාත්‍යාංශයවිසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි රජයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව රජයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩනවාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහිබලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරවවිගණනයකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේදුස්සන්ධානය,ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමහෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් සහ ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා, අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.2.1 (අ) (i) (ii) සහ (iv), 1.6.2.1 (ඇ) (ඈ), 1.6.2.2, 1.6.2.3 (අ), 1.6.2.4 (ආ), 1.6.2.6, 1.6.2.7 (අ) (ආ)සහ 1.6.2.8 (අ) (ආ) (ඇ)ඡේදයන් හි ඇතුලත් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මත ඉදිරිපත් කරන ලද මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද විගණන නිරීක්ෂණයන් ගැලපිමට හෝ ඒවාට අනුකූල වීමට කටයුතු කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

හඳුන්වාදුන් ගිණුම් ආකෘතියට අනුව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම 2005 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණු අතර 2018 වර්ෂයේ අයවැය යෝජනා අංක 254 අනුව, දැනට අනුගමනය කරනු ලබන වැඩිදියුණු කළ මුදල් පදනම් ක්‍රමයේ සිට උපචිත පදනම් ගිණුම් ක්‍රමය යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම වසර 10 ක් තුළ පරිවර්තනය කිරීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද, 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආදායම් සහ වියදම් මුදල් පදනමටත්, වත්කම් හා බැරකම් වැඩිදියුණු කළ මුදල් පදනමටත් වශයෙන් පදනම් දෙකක් භාවිතා කර තිබුණි.

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

#### 1.6.2.1 රාජ්‍ය ණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍යප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනට රජය විසින් ගෙවිය යුතුව තිබුණු රාජ්‍ය ණය ශේෂය රු. මිලියන 12,187,858 ක් වුවද, නියැදි පරික්ෂාවේදී නිරීක්ෂණයවූ කරුණු අනුව එම ණය ශේෂය රු. මිලියන 701,152 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබූ බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ. | | |
| (i) රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධයෙන් එතෙක් පැවති ප්‍රතිපත්තිය 2016 වර්ෂයේ සිට නිවැරදිකර තිබූ අතර, ඒ | අදාල නව ප්‍රතිපත්තියට අනුව ගිණුම්ගත කිරීම යාවත්කාලීන කල යුතුය. | මෙම ගිණුම්ගත කිරීම සඳහා රුපියල් බිලියන 318 ක ප්‍රතිපාදන වෙන්කර ගත යුතුව ඇති බැවින්, 2016 ට පෙර නිකුත් කළ බැඳුම්කරවලට අදාළ |

| | | | |
|---|---|---|---|
| | අනුව භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවේදී ඒවායේ ශුද්ධ අගය වෙනුවට මුහුණත අගයට ගිණුම්ගත කිරීම ආරම්භකර තිබුණි. එසේ වුවද, 2016 වර්ෂයට පෙර නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කරවල මුහුණත වටිනාකම තවදුරටත් ගිණුම්වලට ගැලපුම් නොකිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දින වනවිට මූල්‍ය ප්‍රකාශනවල භාණ්ඩාගාර බැඳුම්කර වලට අදාල මුළු බැරකම රු.මිලියන 318,246 ක් අඩුවෙන් දක්වා තිබූ බව නිරීක්ෂණය විය. | | අවම්ල එම බැඳුම්කර කල්පිරෙන වර්ෂයේදී ගැලපීම් කිරීමටත් එතෙක් මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් ලෙස එම බැඳුම්කරවල මුහුණත අගය හෙළිදරව් කිරීමටත් පියවර ගෙනඇත.අමාත්‍ය මණ්ඩලය ද දැනුවත් කර ඇත. |
| (ii) | හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා රජය විසින් ගනු ලැබ ඇති ණයවලින් 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු.මිලියන 172,717 ක් විය. මේ සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අංක MPS/SEC/2017/32 හා 2017 ජූලි 20 දිනැති "හම්බන්තොට වරාය සහන ගිවිසුම" නම් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට 2017 අගෝස්තු මස 04 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව, හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ණය වලින් තවදුරටත් ගෙවිය යුතුව ඇති ශේෂය ආපසු ගෙවීමේ වගකීම, එකී සහන ගිවිසුම බලාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මහා භාණ්ඩාගාරය විසින් බාර ගෙන තිබූ නමුදු, එම ණය ශේෂය රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. එසේම, එම ණය ශේෂය වරාය අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවලින්ද ඉවත්කර තිබුණි. | රාජ්‍ය ණය ගිණුම්ගත කිරීම විධිමත් කල යුතුය. | හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා ලබාගන්නා ලද ණය මුදල්, 2017 වර්ෂය දක්වා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගෙවනු ලැබූ අතර අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ණය සේවාකරණය භාණ්ඩාගාරය විසින් සිදුකරනු ලබයි.හම්බන්තොට වරාය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්කමකි.එහෙයින් අදාළ ණය මුදලද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පොත්වල සටහන් විය යුතු බවට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින්ද භාණ්ඩාගාර ලේකම් විසින් ද ශ්‍රී ලංකා වරාය අධිකාරිය දැනුවත් කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| (iii) | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II යටතේ, 2019 වර්ෂය තුල ලැබී තිබුණු රු. මිලියන 8,159 ක් වූ විදේශ ණය මුදල, රජයේ මූල්‍ය ප්‍රකාශනවලහෝ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලඇතුලත් වී නොතිබුණි. | රාජ්‍ය ණය ගිණුම්ගත කිරීම විධිමත් කල යුතුය. | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය- අදියර II යටතේ 2019 වර්ෂය තුළ ලැබී තිබුණු රු.මිලියන 8,158,687,137 ක් වූ විදේශ ණය මුදල විසර්ජන පනත යටතේ ලබා ගන්නා ලද ණය මුදලක් නොවන බැවින් එම ණය මුදල ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පොත්වල ඇතුළත් විය යුතු වේ. |
| (iv) | 2019 වර්ෂය තුල උපලබ්දි වූ විදේශ ණය ගිවිසුම් 129 කට අදාලව රු. මිලියන 176,844 ක් හා විදේශ ණය ගිවිසුම් 19 කට අදාලව 2018 වර්ෂය තුල හෝ ඊට පෙර උපලබ්දි වූ රු. මිලියන 33,345 ක් ලෙස එකතුව රු. මිලියන 210,189 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත්, විදේශ ණය ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | දේශීය හා විදේශීය ණය ගිණුම්ගත කිරීම විධිමත් කල යුතුය. | 2018 වර්ෂය තුළ හෝ ඊට පෙර උපලබ්ධි වූ රු.මිලියන 33,345 ට හා 2019 වර්ෂය තුළ උපලබ්ධි වූ රු.මිලියන64,557 අදාළව ගිණුම්ගත කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සතුව නොතිබුණි. 2019 වර්ෂයේ ණය උපලබ්ධීන්ගෙන් රු.මිලියන 24,690 ක්2020.02.28 දින වන විට ගිණුම්ගත කර තිබුණි. |
| (ආ) | රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට අනුව, 2019 වර්ෂය තුල විදේශ ණය ආපසු ගෙවීම් වටිනාකම රු.මිලියන 572,338 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල සටහන 29 (විදේශ ණය ශේෂ ප්‍රකාශනය) අනුව 2019 වර්ෂය තුල විදේශ ණය ගෙවීම් වටිනාකම රු. මිලියන 565,820 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන ඊට අදාල සටහන් සමඟ සැසඳීමේදී විදේශ ණය ආපසු ගෙවීම් වටිනාකමෙහි රු. මිලියන 6,518 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන හා ඊට අදාළ සටහන්වල ඇතුළත් අගයන් නිවැරදි විය යුතුය. | එම වෙනස ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ගිණුම්ගත කර තිබෙන පහත සඳහන් ණය අංක යටතේ ඇති ණය ශේෂයන්ට අදාළව ණය ප්‍රදායක ආයතන වෙත කරන ලද ණය ආපසු ගෙවීම් වේ.<br><br>**ණයඅංකය** — **මුදල (රු. මිලියන)**<br>2007044 — 4,988.86<br>2013014 — 1,529.08<br>**එකතුව** — **6,517.94** |
| (ඇ) | රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනට මුළු රාජ්‍ය ණය ශේෂය රු. මිලියන 12,187,858 ක් වූ නමුදු, ශ්‍රී ලංකා මහ බැංකු තොරතුරුවලට අනුව එදිනට රාජ්‍ය ණය ශේෂය රු. මිලියන 13,301,411 ක් වූයෙන් රජයේ මූල්‍ය ප්‍රකාශන හා මහ බැංකුව | රාජ්‍ය ණය සම්බන්ධ සියළු වාර්තාවල ඇතුළත් අගයන් එකිනෙකට ගැලපීමට හෝසැසඳුම් කිරීමටකටයුතු කල | අදාළ තොරතුරු දෙක එකිනෙකට වෙනස් වූ කළමනාකරණ සහ නෛතික අවශ්‍යතා සපුරාලීම සඳහා එකිනෙකට වෙනස් මූලධර්ම යොදා ගනිමින් ලබා ගනු ලබන බැවින් එම ප්‍රකාශනවල ඇතුළත් තොරතුරු හා |

| | | |
|---|---|---|
| පවත්වාගෙන යනු ලබන තොරතුරු අනුව වූ රාජ්‍ය ණය ශේෂ අතර රු. මිලියන 843,553 ක වෙනසක් නිරීක්ෂණය විය. | යුතුය. | එම තොරතුරු ඉදිරිපත් කරන ආකාරයේ වෙනස්කම් පවතී. |
| (ඇ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 854-1 වාර්තාව හා රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන 29 විදේශ ණය ශේෂ ප්‍රකාශනය සැසඳීමේදී මූල්‍ය ප්‍රකාශන තුල 2019 දෙසැම්බර් 31 දිනට විදේශ ණය ගිවිසුම් 04 කට අදාලව රු. මිලියන 341ක් අඩුවෙන් හා විදේශ ණය ගිවිසුම් 05 කට අදාලව රු. මිලියන 2,049 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබූ අතර විදේශ ණය ගිවිසුම් 02 කට අදාලව රු. මිලියන 01 ක වෙනසක් නිරීක්ෂණය විය. | රාජ්‍ය ණය සම්බන්ධ සියලු වාර්තාවල ඇතුළත් අගයන් එකිනෙකට ගැලපීමට හෝ සැසඳුම් කිරීමට කටයුතු කල යුතුය. | **ඇ. මූල්‍ය ප්‍රකාශනවල විදේශ ණය අඩුවෙන් ගිණුම්ගත වීමට පහත කරුණු හේතු වී ඇත.**<br>i. වර්ෂයේ මුදල් ගෙවා තිබුණත් එය විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත 2020 වර්ෂයේදීවාර්තා වීම.<br>ii. විදේශ ව්‍යවහාර මුදල ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කිරීමේදී ඇ.ඩො එකක් සඳහා අගයන් දෙකක් භාවිතා කිරීම.<br>iii. 2020 වර්ෂයේ ප්‍රදානකරු වෙත නැවත ගෙවා ඇති මුදලක් 2019 වර්ෂයේ වාර්තාවේ ඇතුළත් නොවීම. |

## 1.6.2.2 උපණය

---------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 වනවිට ලබා දී තිබුණුඋප ණයරු. මිලියන 177,149 ක් වුවද, නියැදි පදනම මත සිදුකල විගණන පරික්ෂාවන්හීදී උපණය ගිවිසුම් 05 කට අදාළව මූල්‍ය ප්‍රකාශන හා ශේෂ සනාථ කිරීම් අතර රු. මිලියන1,853 ක වාසිදායක ශේෂයක්ද, උපණය ගිවිසුම් 02 කට අදාළරු. මිලියන 27 ක අවාසිදායක ශේෂයක්ද නිරීක්ෂණය විය. | නිවැරදි හා යාවත්කාලීන වාර්තා හා පොත් පත් පවත්වාගෙන යා යුතුය | භාණ්ඩාගාර පොත් හා ශේෂ සනාථ කිරීම් අතර වූ වාසිදායක ශේෂ ලෙස විගණන විමසුමේ දක්වා ඇති ගිණුම් 05ට අදාළ වෙනස්කම් සඳහා හේතුන් පහත පරිදි වේ. |

| ආයතනය | වෙනස රු | වෙනසට හේතුව |
|---|---|---|
| NLDB Importation ofDiary Animal | 1,759,303,217 | NLDB ආයතනය විසින් 2020.03.11 දිනැතිව ඉදිරිපත් කරන ලද ශේෂ තහවුරු ලිපියේ දැක්වෙන ශේෂය භාණ්ඩාගාර පොත් අනුව ශේෂය සමඟ සැසඳේ. |
| RDB SLP 81 SMILE III RF | 9,000,000 | 2019.12.31දින ව්‍යාපෘතිය වෙත නිදහස් කරන ලද මුදල 2019 වර්ෂය තුළදී ණය දීම සඳහා බැංකුව වෙත නිදහස් කර නොමැති වීම |
| HDFC/NHDA Jalthara housing Loan | 3,410,430 | වෙනසට හේතු හඳුනාගෙන ඇති අතර 2020 වර්ෂයතුළදී අදාළ නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු සිදුකරනු ලැබේ. |
| NDB SLP 81 SMILE III RF | 28,400,000 | 2019.12.31 දින ව්‍යාපෘතිය වෙත නිදහස් කරන ලද මුදල 2019 වර්ෂය තුළදී ණය දීම සඳහා බැංකුව වෙත නිදහස් කර නොමැති වීම |
| DFCC SLP 81 SMILE III RF | 1,106,160 | 2019.12.31 දින ව්‍යාපෘතිය වෙත නිදහස් කරන ලද මුදල 2019 වර්ෂය තුළදී ණය දීම සඳහා බැංකුව වෙත නිදහස් කර නොමැති වීම |

### 1.6.2.3 රජය සතු ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31දින වනවිට රජය සතු ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වය රු. මිලියන 611,961 ක් වුවද,නියැදි පදනම මත සිදුකල විගණන පරීක්ෂාවන්හීදී ආයතන 05 කට අදාලව ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 1,433.5 ක් වැඩියෙන් හා ආයතනයකට දෙකකට අදාලව ප්‍රාග්ධන දායකත්වය රු. මිලියන 25,857.5 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබූ බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ. | | |
| (i) අපනයන සංවර්ධන මණ්ඩලය සඳහා මහා භාණ්ඩාගාරය විසින් රු.10,014,284 ක ප්‍රාග්ධන දායකත්වයක් ලබාදී තිබුණද, ඍජු ශේෂ සනාථ කිරීම් අනුව එය රු.7,904,002 ක් හා UNDP හි ප්‍රාග්ධන දායකත්වය රු. 2,110,282 ක් වීම නිසා 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුල රජයේ ප්‍රාග්ධන දායකත්වය රු.2,110,282 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි හා යාවත්කාලීන වාර්තා හා පොත් පත් පවත්වාගෙන යා යුතුය | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) විසින් ලබාදී ඇති ප්‍රදාන වටිනාකම ආයතනය විසින් UNDP හි ප්‍රාග්ධන දායකත්වයක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන ඇත. |

| | | |
|---|---|---|
| (ii)ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල වෙත මහාභාණ්ඩාගාරයවිසින්රු.1,016,825,160 ක ප්‍රාග්ධන දායකත්වයක් ලබා දී තිබුණු බව දක්වා තිබුණද, ඍජු ශේෂ සනාථ කිරීම් අනුව එම ප්‍රාග්ධනය පහත පාර්ශවයන් විසින් සපයා තිබුණු බව නිරීක්ෂණය විය. | නිවැරදි හා යාවත්කාලීන වාර්තා හා පොත් පත් පවත්වාගෙන යා යුතුය | ශ්‍රී ලංකාව වෙත වනවිදේශ ප්‍රදාන සම්බන්ධයෙන් අදාළපාර්ශවය වන්නේ ශ්‍රී ලංකා රජය වන බැවින් අදාළ ප්‍රදානයන්ගේ වටිනාකමද මෙම ආයතනය සඳහා ශ්‍රී ලංකා රජයේ ප්‍රාග්ධන දායකත්වයක් ලෙස හඳුනා ගෙන ඇත. |

| | Rs. |
|---|---|
| Grant from Japanese Government | 928,851,297 |
| Grant received under Japanese International Co - Operation | 50,124,930 |
| Donation to purchase a Hemo Dialysis Machine | 799,233 |
| Cars & Equipment donated by kajima Corporation of Japan | 260,000 |
| Grant from Olympus Corporation of Japan | 79,700 |
| Central Bank Grants for Cardio - Thoracic Unit | 30,000,000 |
| Grant from President Fund | 6,710,000 |
| | **1,016,825,160** |

| | | |
|---|---|---|
| (iii)ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව සඳහා භාණ්ඩාගාරය විසින් සිදුකල ප්‍රාග්ධන දායකත්වය රු.40,000,000 ක් වුවද, ඍජු ශේෂ සනාථ කිරීම් අනුව එය රු. 30,000,000 ක් පමණක් විය.ඒ අනුව මූල්‍ය ප්‍රකාශන තුල රු.10,000,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි හා යාවත්කාලීන වාර්තා හා පොත් පත් පවත්වාගෙන යා යුතුය. | වෙනසට හේතු වී ඇති රු. 10,000,000 හා සම්බන්ධ ගැලපීම 2012 වර්ෂය තුළදී සිදු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් අමතර තොරතුරු සොයා බලා නිසි ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ගන්නා ලදී. |
| (iv)ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත මහා භාණ්ඩාගාරය විසින් සිදුකල ප්‍රාග්ධන දායකත්වය රු.59,348,887,214ක් වුවද,ශේෂ සනාථ කිරීම් අනුව එය රු.85,106,439,687 ක් විය. ඒ අනුව රජයේ ප්‍රාග්ධන දායකත්වයරු.25,757,552,473 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි හා යාවත්කාලීන වාර්තා හා පොත් පත් පවත්වාගෙන යා යුතුය | ජල සහ අපජල ව්‍යාපෘති වෙනුවෙන් භාණ්ඩාගාරය විසින්සිදු කරනු ලැබූ ණය ආපසු ගෙවීම්හා එහි පොළිය භාණ්ඩාගාරයේ ප්‍රාග්ධන දායකත්වය ලෙස ආයතනය විසින් භාණ්ඩාගාරයේ නිර්දේශයකින් තොරව හඳුනා ගැනීම හේතුවෙන් සිදු වී ඇත. |

| | | | |
|---|---|---|---|
| (v) | භාණ්ඩාගාර පොත් අනුව, ජාතික චිත්‍රපටි සංස්ථාව සඳහා භාණ්ඩාගාරය විසින් සිදුකල ප්‍රාග්ධන දායකත්වය රු.10,000,000 ක් වුවද,සෘජු ශේෂ සනාථ කිරීම් අනුව එසේ ප්‍රාග්ධන දායකත්වයක් සපයා නොමැතිබව දක්වා තිබුණි.ඒ අනුව මූල්‍ය ප්‍රකාශන තුල රු.10,000,000 ක් වැඩියෙන් දක්වා තිබෙන බව නිරීක්ෂණය විය. | නිවැරදි හා යාවත්කාලීන වාර්තා හා පොත් පත් පවත්වාගෙන යා යුතුය | ශ්‍රී ලංකා රජය විසින් ජාතික චිත්‍රපට සංස්ථාව වෙත ලබා දී ඇති ප්‍රාග්ධන දායකත්වය රු. මිලියන 10 ක් වන අතර නිවැරිදි ශේෂ සනාථ කිරීමේ ලිපියක් ආයතනය වෙතින් ලබා ගැනීමට සටහන් කර ගතිමි. |
| (vi) | **නාගරික සංවර්ධන අධිකාරිය** | | |
| | • නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව, රජයේ ප්‍රාග්ධන දායකත්වය රු. 100,000,000 ක් වුවද, රජයේ මූල්‍ය ප්‍රකාශන වල එවැනි ශේෂයක් පෙන්නුම් නොකෙරුණි.<br>• රජය විසින් අධිකාරිය වෙත ලබා දී තිබුණු රු. 1,257,651,060 ක ප්‍රදාන මුදලක් රජයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන දායකත්වය යටතේ දක්වා තිබුණද, නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ප්‍රදාන මුදල වාර්ෂිකව පොත්වලින් ලියා හරිමින් පැවතුනු ශේෂයක් විය. ඒ අනුව 2019 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂය රු.922,649,889 ක් වූ නමුත් ආයතනයෙන් ලද ශේෂ සනාථ කිරීම් අනුව එය රු. 863,079,889 ක් විය. | නිවැරදි හා යාවත්කාලීන වාර්තා හා පොත් පත් පවත්වාගෙන යා යුතුය | නාගරික සංවර්ධන අධිකාරිය වෙත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සඳහා ලබාදී ඇති රු. 1,257,651,060 ක මුදලමහා භාණ්ඩාගාරය විසින් ආයතනය වෙත සිදු කර ඇති ප්‍රාග්ධන දායකත්වයක් ලෙස සටහන් කර ඇත. කෙසේ වුවද ලියා හැරීමක් සඳහා අනුමැතියක් ලබා දී ඇතිද යන වග නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් විමසා ඇති අතර මේ වන තෙක් පිළිතුරු එවා නොමැත. |
| (ආ) | රජයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2019 වර්ෂය තුල රජය සතු ව්‍යාපාරවල සිදුකරන ලද ප්‍රාග්ධන දායකත්වය රු. මිලියන 29,145 ක් වුවත්, 2019 වර්ෂය තුල වැය විෂයය අංක 2301 යටතේ ගිණුම්ගත කර තිබූ වටිනාකම | රජය සතු ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වය ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතුය. | 2301 වැය විෂය යටතේ ගිණුම්ගත කරනු ලබන්නේ රජය විසින් අයවැය ප්‍රතිපාදන යටතේ රාජ්‍ය ව්‍යවසාය වෙත සිදු කරනු ලබන හිමිකම් දායකත්ව පමණි. එහෙත්, ජාතික ජල සම්පාදන |

| | | |
|---|---|---|
| රු. මිලියන 24,910 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා 2301 වැය විෂය යටතේ ගිණුම්ගත කල වටිනාකම අතර රු. මිලියන 4,235 ක වෙනසක් නිරීක්ෂණය විය. | | මණ්ඩලය හැර පෙන්වා දී ඇති අනෙකුත් වෙනස්කම් රජයේමූල්‍යා ප්‍රකාශන තුළ සිදු කරනු ලැබූ අනෙකුත් ගැලපීම් සහ නිවැරිදි කිරීම් වේ. එම ගැලපීම් 2301 වැය විෂය යටතේ සටහන් කිරීම සිදු නොවේ. |
| (ඇ) වැවිලි සමාගමක රජය සතු ප්‍රාග්ධන දායකත්වය රු.10 බැගින් වූ කොටස් 1,900,276 කින් සමාලෝචිත වර්ෂය තුල ඉහළ ගොස් තිබුණද, 2019 දෙසැම්බර් 31 දිනට එහි ප්‍රාග්ධන වටිනාකමෙහි කිසිදු වැඩිවීමක් සිදුවී නොතිබුණි. එසේම ඍජු ශේෂ සනාථ කිරීම් හා භාණ්ඩාගාර වාර්තා අතර රු. මිලියන 3 ක වෙනසක් නිරීක්ෂණය විය. | රජයේ ඍජු ප්‍රාග්ධන දැයකත්වය මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂය තුළ කොටස් ප්‍රමාණය5,700,834 ක් දක්වා ඉහල යාමට සාපේක්ෂව ප්‍රාග්ධන වටිනාකමේ සිදු විය යුතු වෙනස්කම නිසි පරිදි ගැලපීමට සටහන් කර ගතිමි.<br>ශේෂ සනාථ කිරීමේදී අදාළ වටිනාකම වෙළඳපොළ වටිනාකම මත පදනම්ව ඉදිරිපත් කරන බැවින් අදාළ ශේෂයන් දෙක අතර වෙනසක් පැවතිය හැක. |

### 1.6.2.4 බැරකම්

---------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශනවල උපලේඛන III හි සඳහන් රු.මිලියන 164,567.21 ක බැරකම් 2019 වර්ෂයේදී ලබා ගත් වැඩ, භාණ්ඩ හා සේවා වෙනුවෙන් බැවින් එය මූල්‍ය ප්‍රකාශනය තුළ ගිණුම්ගත කළ යුතුව තිබුණි. එසේ නොකිරිම නිසා 2019 වර්ෂයේදී සත්‍ය වශයෙන් ලබා ගත් වැඩ, භාණ්ඩ හා සේවා සඳහා වන වියදම රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වී නොතිබුණි. | අවශ්‍ය සියළු තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන යාවත්කාලීනව හා නිවැරදිව ඉදිරිපත් කල යුතුය. | මු.රෙ. 94 හා 115 යටතේ වාර්ෂික විසර්ජන පනත මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත එළඹෙන ලද බැරකම් සඳහා එම වර්ෂය තුළදීම හැකිතාක්දුරට ගෙවීම් සිදුකර අවසන් කළ යුතු ය. දැනට ජනරජයේ මූල්‍ය ප්‍රකාශන වැඩිදියුණු කළ මුදල් පදනම මත පිළියෙල කරන බැවින් බැරකම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනුයේ දිගුකාලීන කාලපරිච්ඡේදයක් තුළ ණය ආපසු ගෙවීම් සඳහා එළඹෙන ලද ගිවිසුම් මත මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් ලබාගැනීම වෙනුවෙන් වූ බැරකම් පමණි.<br>එහෙත් ප්‍රායෝගිකව සෑම වර්ෂයකම විසර්ජන පනතින් වෙන් කරන |

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රතිපාදනයන්ට සරිලන අක් මුදල් නිදහස් කිරීමක් සිදුනොවන බැවින් වර්ෂය තුළ නිරවුල් නොවූ බැරකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් හෙළිදරව් කළ නොහැකි අතර එකී බැරකම් පිළිබඳ විස්තර ගිණුම් සටහනක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ. |
| (ආ) | 2015 අයවැය යෝජනාවක් අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂ බැංකුවල රු. මිලියන 1.5 ක් හෝ ඊට අඩුවෙන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් පවත්වා ගෙන යනු ලබන ස්ථාවර තැන්පතු සඳහා සියයට 15 ක පොළී ප්‍රතිශතයක් ගෙවනුලබන අතර එහිදී, සාමාන්‍ය පොළී අනුපාතය හා ගෙවනු ලබන සියයට 15 ක පොළී අනුපාතය අතර වෙනස මහා භාණ්ඩාගාරය විසින් අදාල බැංකු වෙත ප්‍රතිපූර්ණය කිරීමට එකඟවී තිබුණි. ඒ අනුව 2019 දෙසැම්බර් 31 දිනට එම අතිරේක පොළිය ලෙස රාජ්‍ය බැංකු 07 කට හා පෞද්ගලික බැංකු 22 කට ගෙවිය යුතු මුළු වටිනාකම රු. මිලියන 50,038 ක් වූ අතර, එම මුදල රජයේ මූල්‍ය ප්‍රකාශනවල බැරකමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. | අවශ්‍ය සියළු තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන යාවත්කාලීනව හා නිවැරදිව ඉදිරිපත් කල යුතුය. | ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා පොළී සහනාධාර ගෙවීමේ වැඩසටහනට 2015 වර්ෂයේ සිට ප්‍රමාණවත් පරිදි අයවැය ප්‍රතිපාදන නොලැබීම, අක්මුදල් නොලැබීම හා ප්‍රතිපාදන ආපසු පවරාගැනීම මගින් අයවැයකළමනාකරණය කිරීම නිසා, 2019.12.31 දින වන විට තිබුණු රු.45,845,944,814.42 ක් වූ සමස්ථ පොලී සහනාධාරයේ වටිනාකම ගෙවා දැමීමට නොහැකි විය. |
| (ඇ) | මහාමාර්ග පුළුල් කිරීම් හා සංවර්ධනය කිරීම් සහ අධිවේගී මාර්ග ඉදිකිරීම සඳහා ශ්‍රීලංකා රජය වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දේශීය බැංකු වලින් ලබාගත් ණය මුදල් වෙනුවෙන් ණය වාරික හා පොළී ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු එකතුව රු. මිලියන 19,353 ක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල එවැනි ගෙවිය යුතු මුදලක් ඇතුලත් කර නොතිබුණි. | අවශ්‍ය සියළු තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන යාවත්කාලීනව හා නිවැරදිව ඉදිරිපත් කල යුතුය. | මාර්ග සංවර්ධන අධිකාරියට ණය සේවාකරණය කිරීමේ හැකියාව නොමැති අවස්ථාවලදී ණය ගෙවීම සඳහා හිඟ මුදල් ලබාදීම සඳහා පමණක් මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රාග්ධන දායකත්වයක් වශයෙන් භාණ්ඩාගාරය විසින් අරමුදල්සපයාදීමක් සිදු කළද, මහා භාණ්ඩාගාරය විසින් ඍජුවම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබාගෙන ඇති ණය ගෙවීමක් සිදු කරනු නොලැබේ.<br>කෙසේ වුවද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය වගකීම් යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් දේශීය |

| | | | |
|---|---|---|---|
| | | | බැංකු වෙත නිකුත් කර ඇති භාණ්ඩාගාර ඇපකර පිළිබඳ තොරතුරු දක්වා ඇත. |
| (ඇ) | හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ලබාගත් විදේශ ණය මුදල් වෙනුවෙන් ණය වාරික හා පොළී ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු එකතුව රු. මිලියන 5,150 ක මුදලක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණත්, රජයේ මූල්‍ය ප්‍රකාශනවල එවැනි ගෙවිය යුතු මුදලක් ඇතුලත් කර නොතිබුණි. | අවශ්‍යා සියළු තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන යාවත්කාලීනව හා නිවැරදිව ඉදිරිපත් කල යුතුය. | හම්බන්තොට වරාය ඉදිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් වාර්ෂිකව ගෙවිය යුතු විදේශ ණය සහ පොළී සඳහා මහා භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධන දායකවීම් යටතේ අරමුදල් සපයනු ලබන අතර මහා භාණ්ඩාගාරයේ පොත්වල එලෙස සපයනු ලබන අරමුදල් පමණක් වාර්තා කරනු ලබයි. භාණ්ඩාගාරය විසින් ශ්‍රී ලංකා වරාය සංවර්ධන අධිකාරියට ඉදිරියේදී එලෙස ලබාදිය යුතු අරමුදල් ප්‍රමාණය භාණ්ඩාගාරයේ බැරකමක් ලෙස හඳුනා නොගනී. |

## 1.6.2.5 රජයට අයත් ශුද්ධ ආයෝජන හා ප්‍රතිමූල්‍යයන ණය ගැනීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුවේ පවතින තොරතුරු අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන ණය යෝජනා ක්‍රම 12 කට අදාල එකතුවරු. මිලියන 13,426 ක ගිණුම් ශේෂ, ශ්‍රී ලංකා මහ බැංකුවට අයත් නොවන බවත් එම ශේෂ ශ්‍රී ලංකා රජය සතු ආයෝජන හා ප්‍රතිමූල්‍යයන ණය ගැනීම් බවත් විගණනයට දන්වා තිබුණත්, එම ගිණුම් ශේෂ රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි | අවශ්‍යා සියළු තොරතුරු ඇතුළත් කරමින් මූල්‍ය ප්‍රකාශන යාවත්කාලීනව හා නිවැරදිව ඉදිරිපත් කල යුතුය. | ණය යෝජනා ක්‍රම 02 පමණක් රජයේ මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් තර තිබූ අතර මේ වන විට සම්පූර්ණ ණය මුදලම පියවා ඇති බැවින් 2019 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොවේ. අනෙකුත් ණය යෝජනා ක්‍රමවලට අදාළ ගිණුම් ශේෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් සමඟ සාකච්ඡාකොට සැබවින්ම රජයේ ගිණුම්වලට ගත යුතු ගිණුම් ශේෂ පවතී නම් එකඟතාවයකට පැමිණීමෙන් අනතුරුව සුදුසු පරිදි ගිණුම්වලට ඇතුළත් කිරීමට ක්‍රියාමාර්ග ගනු ලබනබව දන්වමි. |

## 1.6.2.6 නිරවුල් නොවූ ශේෂ

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව දීර්ඝ කාලයක් තිස්සේ අක්‍රීයව පවතින ගිණුම් 08 කට අදාලව රු. මිලියන 1,146 ක හර ශේෂ නිරවුල් නොකර දිගින් දිගටම මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල ඇතුලත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුළ නිරවුල් හා යාවත්කාලීන අගයන් ඇතුළත් කළ යුතුය. | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුවේ නිර්දේශ ලැබුණු පසු ඒ අනුව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ. |

## 1.6.2.7 විදේශ ප්‍රදාන

---------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන විදේශාධාර ගිණුම් තැබීමට අදාල රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, විදේශ ආධාර සම්බන්ධ සියලු ගනුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කලයුතු බව සඳහන් වුවද, නියැදි පරීක්ෂාවක් මත ලබාගත් තොරතුරු අනුව, 2018 හා 2019 වර්ෂවල මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව ආයතන 24 ක් විසින් ව්‍යාපෘති 77 ක් සඳහා රු. මිලියන 2,026 ක විදේශ ප්‍රදාන ඍජුවම අදාළ ආයතන වෙත ලබාගෙන තිබුණි. මෙම ප්‍රදානයන් පිළිබඳ තොරතුරු මහා භාණ්ඩාගාරයේ වාර්තාවල ඇතුළත් වී නොතිබුණු අතරම වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙත මෙවැනි ප්‍රදාන ලැබී තිබේද යන වග තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් මහා භාණ්ඩාගාරය සතුව නොමැති බව නිරීක්ෂණය විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විදේශ ආධාර ලබා ගැනීම හා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතුය. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94 න් සංශෝධිත 2.0 ඡේදය ප්‍රකාරව හා මුදල් රෙගුලාසි සංග්‍රහයේ XI පරිච්ඡේදයෙහි වූ විධිවිධාන නොසළකා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනු දැනුමකින් තොරව ඍජුවම විදේශ ප්‍රදාන ලබාගන්නා රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් කටයුතු කරන ලෙස රේඛීය අමාත්‍යාංශලේකම්වරුන් වෙත උපදෙස් නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| (ආ) 2019 වර්ෂය තුල විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත විදේශ ප්‍රදාන ලෙස ලැබෙන මුදලින් අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා එක් එක් වැය විෂයය යටතේ එකතුව රු. මිලියන 13,341 ක අයවැය ප්‍රතිපාදන ලබාදී තිබුණත්, වර්ෂය තුළ අදාළ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණේ රු. මිලියන 7,259 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 54.41 ක් පමණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විදේශ ආධාර ලබා ගැනීම හා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතුය. | මෙම තත්ත්වය වළක්වාලීම/අවම කිරීම සඳහා පාලනයෙන් බැහැර අවස්ථාවන් හැරුණු කොට විදේශ ප්‍රදාන මත සලසා දුන් අයවැය ප්‍රතිපාදන ඌණඋපයෝජනය සම්බන්ධයෙන් පිළිගත හැකි හේතු අදාළ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු බවට අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත ලබාදීමට නියමිත ඉහත (අ) හි සඳහන් උපදෙස්හි ඇතුළත් කිරීමට පියවර ගනු ලැබේ. |

## 1.6.2.8 මූල්‍ය නොවන වත්කම්

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් (Non-Financial Assets) වටිනාකම රු. මිලියන 1,355,270 ක් විය. ඊට අදාල, මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 16 හි ඇතුලත් ආයතන අතුරින්, නියැදි පදනම මත තෝරාගත් ආයතන 80 ක, 2019 වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ඒ.සී.ඒ - 6 ආකෘතියේ එනම් “මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ” ඇතුලත් 2019 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය නොවන වත්කම් ශේෂය, සමඟ සැසඳීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නියැදි පදනම මත තෝරාගත් ආයතන 9 ක, 2019 වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ඒ.සී.ඒ - 6 ආකෘතියේ ඇතුලත් “මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශවලට” සාපේක්ෂව රජයේ මූල්‍ය ප්‍රකාශන තුල එකතුවරු. මිලියන 3,630 ක මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත වී නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතුය. | ජනරජයේ අවසන් මූල්‍යප්‍රකාශනවල දක්වා ඇති මූල්‍යනොවන වත්කම් වටිනාකම එක් එක් වියදම් ඒකක විසින් රාජ්‍යගිණුම් දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියට තම ආයතනයේ මූල්‍ය බනොවන වත්කම් පාලන ගිණුමේ ශේෂය සමඟ කේවළ වත්කම් ශේෂ සසඳා වාර්තා කළ අගයන් පමණක් ඇතුළත් වී ඇත. එහෙත් එලෙස පාලනශේෂය සමඟ තවදුරටත් නොසැසඳෙන වත්කම් එකී ආයතනය සතුව පැවතිය හැකි අතර එකී නොසැසඳෙන හා තවදුරටත් වාර්තා කළ යුතු වත්කම් |
| (ආ) නියදි පදනම මත තෝරාගත් ආයතන අතුරින් ආයතන 10 ක මූල්‍ය නොවන වත්කම් ශේෂය රු. මිලියන 85,818 ක් වූ අතර, එම ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශනවල ඒ.සී.ඒ - 6 අකෘතිය අනුව එම ශේෂය රු. මිලියන 50,868 ක් වීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු. මිලියන 34,950 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතුය. | |

| | | |
|---|---|---|
| **(ඇ) අදාල ආයතනවල මූල්‍ය ප්‍රකාශනවලට සාපේක්ෂව, රජයේ මූල්‍ය ප්‍රකාශන තුල අඩුවෙන් ගිණුම්ගත වූ මූල්‍ය නොවන වත්කම්**<br><br>නියැදි පදනම මත තෝරාගත් ආයතන 25 ක මූල්‍ය නොවන වත්කම් ශේෂයරු. මිලියන 217,882 ක් වූ අතර, එම ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශනවල ඒ.සී.ඒ - 6 අකෘතිය අනුව එම ශේෂය රු. මිලියන 366,981 ක් වීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු. මිලියන 149,099 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතුය. | වාර්තා කිරීම සඳහා වර්ෂ 05 ක කාලයක් ලබාදී ඇත. |

## 2 මූල්‍ය සමාලෝචනය
---------------------

## 2.1 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම
-----------------------------------------------

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සිදුකල පරික්ෂාවේදී පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | | |
| (අ) **2019 අප්‍රේල් මස 05 වන දිනැති 2019 අංක 6 දරන විසර්ජන පනත**<br>(i)පනතේ 2(1) (ආ) වගන්තිය | 2019 මුදල් වර්ෂය තුල ලබාගනු ලබන ණය මුදල් වලින් පැන නගින ඉතිරි ශේෂය 2019 මුදල් වර්ෂය තුල කවර හෝ අවස්ථාවකදී හෝ වර්ෂය අවසානයේදී රු. බිලියන 2,079 ක් නොඉක්මවිය යුතුව තිබුණි. එහෙත් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පනතේ විධිවිධාන ප්‍රකාරව ලබාගෙන තිබුණු ණය ප්‍රමාණය රු.බිලියන 2,158ක් වී තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ඉහත කී ණය සීමාව රු. බිලියන 79කින් ඉක්මවා තිබුණි. | විසර්ජන පනතේ විධිවිධාන ප්‍රකාරව අනුමත ණය සීමාව තුළ ණය කළමනාකරණය කර ගත යුතුය. | රටෙහි පැවති ආර්ථික පසුබෑම හේතුවෙන් 2019 වර්ෂයේ අපේක්ෂිත ආදායම නොලැබීමත් 2018 වර්ෂයේ ඉටුකළ වැඩ හා සේවා වෙනුවෙන් නොපිය වූ බිල්පත් 2019 වර්ෂයේදී ගෙවීමට සිදුවීමත් හා පරිපූරක ඇස්තමේන්තු මගින් බලය පවරන ලද වියදම් මුළු ණය ගැනීම් සීමාව තුළ කළමනාකරණය නොවීමත් හේතුවෙන් ඉක්මවා යන ලද ණය ගැනීම් සීමාව ආවරණය කර ගැනීම සඳහා අනුමත ණය සීමාව රු. බිලියන 2279ක් දක්වා බිලියන 200 |

| | | | |
|---|---|---|---|
| | | | කින් වැඩිකිරීමට මුදල් ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2019.11.27 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. |
| (ii)8 (1) (ආ) වගන්තිය | විසර්ජන පනතේ iii වන උපලේඛනය යටතේ වන අත්තිකාරම් කාර්යයන් වෙනුවෙන් විෂයය අංක 15 ක් යටතේ පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු උපරිම වියදම් (හර) සීමාව රු. මිලියන 1,277 කින් ඉක්මවා කටයුතු කර තිබුණු අතර විෂයය අංක 12 ක් යටතේ පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු අවම ලැබීම්සීමාවට ලඟා නොවීම්රු. මිලියන 132 ක් පවතින බව නිරීක්ෂණය විය. තවද, විෂයය අංක 05 ක් යටතේ පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු උපරිම හරශේෂසීමාව රු.මිලියන 123 කින් ඉක්මවා කටයුතු කර තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව අනුමත සීමාවන් තුළ අත්තිකාරම් කාර්යයන් සිදු කළ යුතුය. | මුදල් රෙගුලාසි 503(1) යටතට ගැනෙන අත්තිකාරම් ගිණුම් සඳහා නියමිත සීමාවල ඉක්මවීම් / පහත වැටීම් සම්බන්ධව අදාළ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු අත්තිකාරම් ගිණුම් වාර්ෂික සැසඳුම් ප්‍රකාශ මගින් ඉදිරිපත් කර ඇත.<br><br>මුදල් රෙගුලාසි 503(1) යටතට නොගැනෙන සීමා ඉක්මවීම් සහ සීමාවලට ළඟා නොවීම් මුදල් රෙගුලාසි 503(2) ට අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර, දැනට පාර්ලිමේන්තුව ක්‍රියාත්මක නොවන බැවින් අභිනව පාර්ලිමේන්තුව පත් වූ පසු එම සීමා සංශෝධන ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමට අපේක්ෂා කරමි. |
| (ආ) **2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත** | | | |
| (i) 3(ඊ) වගන්තිය | යම් වර්ෂයක් අවසානයට පැවතිය හැකි උපරිම බැරකම් වටිනාකම එම වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 80 නොඉක්මවිය යුතුය.එම සීමාවන්ට අනුගතව මුදල් අමාත්‍යාංශය කටයුතු කර ඇති බව මූල්‍ය ප්‍රකාශන අනුව, විද්‍යාමාන වුවද,2019 දෙසැම්බර් 31 දිනට ගිණුම් ගත නොකළ විදේශ ණය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට බැහැරින් ගිණුම් තබා තිබුණු විවිධ රාජ්‍ය ව්‍යවසායවලට අදාල බැරකම්දසැලකිල්ලට ගත්විට එම අදාල සීමාව ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය. | පනතේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. | **(i) ශේෂපත්‍රයෙන් පිටත ගිණුම් තබන විදේශ ණය**<br><br>රජය විසින් ඇති කර ගත් ගිවිසුම්ගත බැඳීම් යටතේ වූ ණය ගිවිසුම් 08කට අදාළව 2019 දෙසැම්බර් 31 දිනට පැවති බැරකම් වටිනාකම වූ රුපියල් මිලියන 345,453 ක මුදල, ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නැත. ඒ අනුව එම ණය ගිවිසුම් 08 සම්බන්ධව පහත සඳහන් පරිදි කටයුතු කර ඇත. |

(අ) පුත්තලම ගල් අඟුරු බලාගාරය ඉදිකිරීම ලංකා විදුලිබල මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති වන අතර එම ව්‍යාපෘතිවලට අදාළ ණය ආපසු ගෙවීම් හා පොළී ගෙවීම 2019 වර්ෂයේ සිට ලංකා විදුලිබල මණ්ඩලය සඳහා කරනු ලබන ප්‍රාග්ධන දායකත්වය ලෙස සලකා ගිණුම්ගත කරනු ලැබේ.

(ආ)මත්තල අන්තර්ජාතික ගුවන් තොටුපල ව්‍යාපෘතියට අදාළ ණය මුදල ආපසු ගෙවීම ආරම්භයේ සිටම කරනු ලබන්නේ ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම විසිනි.

(ඇ) හම්බන්තොට වරාය ඉදිකිරීමේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් කල්බදු ගිවිසුමක් යටතේ පවරා ඇති නමුදු, එකී වත්කමෙහි තවදුරටත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුවන අතර එය ගොඩනැගීම සඳහා ලබාගන්නා ලද ණය මුදල ද එම අධිකාරියේ වගකීමක් වේ.

**(ii) භාණ්ඩාගාර බැඳුම්කර ශේෂය අඩුවෙන් ගිණුම් ගත කිරීම**

2016 ට පෙර නිකුත් කළභාණ්ඩාගාර බැඳුම්කරවලට අදාළ අවමිල එම බැඳුම්කර කල්පිරෙන වර්ෂයේදී ගැලපීම් කිරීමටත් එතෙක් මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් ලෙස එම බැඳුම්කරවල මුහුණත අගය හෙළිදරව් කිරීමටත් පියවර ගෙන ඇත.

**(iii) ගිණුම් ගත නොකළ විදේශ ණය**

2019 වර්ෂයේ වාර්ෂික විසර්ජන පනතේ ප්‍රමාණාත්මක ප්‍රතිපාදන වෙන්කර නොතිබියදී භාණ්ඩාගාරයේ පාලනයෙන් බැහැරව ඇතැම් අමාත්‍යාංශවල ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතින්හි ප්‍රතිලබ්ධීන් සිදුවී තිබීමත් ප්‍රතිපාදන පැවතිය ද 2019 වර්ෂයේ ගිණුම් පියවන අවස්ථාව වන විට ගිණුම් ගත කිරීම සඳහා ඉදිරිපත් නොවීම මෙන්ම වාර්ෂික ණයගැනීම් සීමාව වැඩිකර ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට සැලසුම් කළ පනත් කෙටුම්පත සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට අවස්ථාවක් නොලැබීම හේතුවෙන් ගිණුම්ගත කිරීම සඳහා ඉදිරිපත් වූ ඇතැම් ප්‍රතිලබ්ධීන් ගිණුම් ගත කිරීමට නොහැකි විය.

**(iv) සූරියවැවජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා ගෙවීම් කිරීමට ලබාගත් ණය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ මහජන බැංකුව අතර ණය ගිවිසුමකට එළඹීමට අනුමැතිය ලබාදී ඇති අතර පොළිය හා

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රාග්ධන ගෙවීම් සඳහා සුදුසු ප්‍රතිෂ්ඨාවක් මුදල් අමාත්‍යාංශය විසින් ලබාදීම අනුමත කර ඇත. ඒ අනුව 2017.12.17 දින භාණ්ඩාගාරය විසින්, Letter on Securing debt services ලිපියක් මහජන බැංකුව වෙත නිකුත් කර ඇත.<br>රජයේ නිශ්චිත බැරකම් නොවන අසම්භාව්‍ය වගකීම් ලෙස දක්වා ඇති භාණ්ඩාගාර ඇපකර සහ සහන ලිපිවල වටිනාකම වන රු. මිලියන 858 අවිනිශ්චිත බැරකමක් වන බැවින් බැරකම් සීමාවට ඇතුලත් කල නොහැක. |
| **(ii) 3 (**අ) වගන්තිය | "2006 වර්ෂය අවසානයේ අයවැය පරතරය, එම වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන බවට සහ එම මට්ටම ඉන්පසු දිගටම පවත්වාගෙන යනු ලබන බවට වගබලා ගත යුතු බව පනතේ දක්වා තිබුණි.එසේ වුවද සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය පරතරය, ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන පරිදි ඇස්තමේන්තු කිරීමටත්, සමාලෝචිත වර්ෂය අවසානයට වූ තථ්‍ය අයවැය පරතරය, ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන පරිදිපවත්වාගෙන යාමටත් පොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තුගත අයවැය පරතරය සියයට 6.28 ක් හා තථ්‍ය අයවැය පරතරයට අදාළව සියයට 6.74 ක් විය. | පනතේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. | 2003 අංක 03 දරන මූල්‍ය කළමණාකරන වගකීම් පනතේ 3(අ) වගන්තියට අනුව අයවැය හිඟය ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5 නොඉක්ම වියයුතුය යන ප්‍රකාශය නිවැරදිය. එමෙන්ම මෙහිදි අයවැය හිඟය වශයෙන් අදහස් කරනු ලබන්නේ ආර්ථික වර්ගීකරණය අනුව සකස් කළ අයවැය හිඟයයි. පනතෙහි සඳහන් එම ඉලක්කය කරා ගමන් කිරීමට අපහසු තත්ත්වයක් වේනම් ඒ පිළිබඳව හේතු ඉදිරිපත් කර අනාගත වැඩපිළිවෙළ පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කළයුතු බව පනතෙහි දක්වා ඇති අතර ඒ අනුව යමින් අදාළ පනතට අනුව ඉදිරිපත් කරනු ලබන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව තුළ එම කරුණු පැහැදිලි කර ඇති බව දන්වනු කැමැත්තෙමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල අග්‍රිම ගිණුම් ශේෂයන් සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට පියවිය යුතු වුවත්, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 35 ක එකතුව රු. මිලියන 2,606 ක් වූ අග්‍රිම ශේෂයන් එපරිදි පියවා නොතිබුණු අතර ඒ තුල වසර ගණනාවක සිට පැවත එන එකතුව රු. මිලියන 324 ක් වූගිණුම් ශේෂ ඇතුලත් වී තිබුණි . | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. | 2019.12.31 දිනට තවදුරටත් නොපිය වී පවතින අග්‍රිම ගිණුම් සැසඳීම් කර නිරවුල් කරන ලෙසට අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු දැනුවත් කර ඇත. |
| (ඈ) **2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය** | | | |
| (i) 2 (අ) වගන්තිය | 2019 වර්ෂය සඳහා වැය ශිර්ෂ 19 කට අදාළ වැය විෂයයන් 64 ක් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණත්, 2019 වර්ෂය වෙනුවෙන් එම වැය විෂයයන් යටතේඑකතුව රු.මිලියන 2,178 ක බැරකම්වලට එළඹ තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතු අතර බැරකම් ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතුය. | වාර්ෂික විසර්ජන පනත යටතේ වෙන්කරනු ලබන හෝ අතිරේක ප්‍රතිපාදන මගින් ලබාදී ඇති ප්‍රතිපාදන සීමාව තුළ බැරකම්වලට එළඹිය යුතු බව රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 මගින් නිශ්චිතව උපදෙස් ලබාදී ඇත. ඒ අනුව, එම පාලනයන් ඉක්මවා බැඳීම් හා බැරකම්වලට එළඹීම පිළිබඳව එකී ආයතන වෙතින් පැහැදිලිකිරීම් ලබාගැනීම වඩාත් සුදුසු වේ. |
| (ii) 2 (ඇ) වගන්තිය | චක්‍රලේඛය ප්‍රකාරව කිසිදු බැරකමක්ඉදිරි වර්ෂයට ගෙන යා නොහැකි බවට උපදෙස් ලබා දී තිබුණත්, වැය ශිර්ෂ 177 ක වැය විෂයයන් 722 ක් යටතේ සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය වූ එකතුව රු.මිලියන 17,783 ක ප්‍රතිපාදනය රු.මිලියන81,977 කින් ඉක්මවා රු.මිලියන 99,760 ක බැරකම්වලට එළඹ තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතු අතර බැරකම් ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතුය. | වාර්ෂික විසර්ජන පනත යටතේ වෙන්කරනු ලබන හෝ අතිරේක ප්‍රතිපාදන මගින් ලබාදී ඇති ප්‍රතිපාදන සීමාව තුළ බැරකම්වලට එළඹිය යුතු බව රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 මගින් නිශ්චිතව උපදෙස් ලබාදී ඇත. එම පාලනයන් ඉක්මවා බැඳීම් හා බැරකම්වලට එළඹීම පිළිබඳව එකී ආයතන වෙතින් පැහැදිලිකිරීම් ලබාගැනීම වඩාත් සුදුසු වේ. |

| | | | |
|---|---|---|---|
| **(ඉ) අංක 243/2015 හා 2015 ජුනි 24 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය** | 6003 කාණ්ඩයේ තැන්පත් ගිණුම් ශූන්‍ය කිරීමට අපේක්ෂා කර තිබුණු අතර 2016 වර්ෂයේ සිට එම කටයුතු වාර්ෂික ඇස්තමේන්තුව හරහා සිදු කිරීමට උපදෙස් ලබා දී තිබුණි. එසේ වුවද, අංක 6003 යටතේ වන තැන්පතු ගිණුම් 3 ක රු. මිලියන 10.111 ක් වූ එකතු ශේෂයක් නිරවුල් නොකොට තවදුරටත් ඉදිරියට ගෙන යමින් පැවතුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. | මෙම ශේෂයන් අතුරින් කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේරු. මිලියන10 ක හර ශේෂය රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර කපා හැරීම සඳහා කටයුතු කෙරෙන අතර රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රු.108,029.77ක ශේෂය ආදායමෙන් ආපසු ගැනීමේ අයදුම් පත්‍රයක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යොමුකර අනුමැතිය ලබාගෙන නිවැරදි කිරීමට කටයුතු කෙරේ. |

## 2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

### 2.2.1 උපණය අයකර ගැනීම

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ මූල්‍ය ප්‍රකාශනවලටඅනුව, 2019 දෙසැම්බර් 31 දින වනවිට ලබා දී තිබූ උප ණය ශේෂය රු.177,149,514,240 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය. | | |
| (අ) උපණය වාරික හා පොළී අයකර ගැනීම් හිඟව පවතින ආයතනවලින් අයවිය යුතු හිඟ ආදායම් අයකර ගැනීම සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් සතුටුදායක මට්ටමක නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුවණය වාරික ලෙස අයවිය යුතු රු. 10,047,406,029 ක් හා ණය පොළිය ලෙස අයවිය යුතු රු.2,134,732,056 ක් ලෙස එකතුව රු.12,182,138,085 ක හිඟ මුදල් අයකරගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ. | විධිමත් ක්‍රියාමාර්ගයන් මඟින් හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම ණය ශේෂයන් පියවා ගැනීම සඳහා ගතහැකි සියළු ක්‍රියාමාර්ග ගැනීමට මහා භාණ්ඩාගාරය විසින් කටයුතු කර තිබේ. ඒ අනුව, අක්‍රීයව පැවති සී/ස ජාතික කඩදාසි සමාගම වෙත ලබාදුන් රු. 50,000,000.00 ක් හා ලංකා පිගන් සංස්ථාව වෙත ලබා දී තිබූ රු. 8,676,923.00 ක ණය මුදල් මේ වනවිටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත කපාහැරීමට කටයුතු කර ඇති අතර නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබා දී තිබූ ණය මුදලින් දිගුකාලයක් තිස්සේ |

| | | | |
|---|---|---|---|
| | | | අයවීමට තිබූ රු.275, 578,710.85 ක් හා හිඟ පොළිය වූ රු. 564,199,380.61 ක් ද 2019 වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කර තිබේ. |
| (i) | ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව වෙත 1999 හා 2000 වර්ෂවල ලබා දී තිබූ රු.550,990,000 ක් හා රු.222,350,000 ක් හා ඒ මත අය විය යුතු පොළිය වූ රු.612,893,552 ක් වශයෙන් එකතුව රු.1,386,233,552 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත් වී තිබුණි. | විධිමත් ක්‍රියාමාර්ගයන් මඟින් හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මුදල් අමාත්‍යාංශයේ නිර්දේශ සලකා බලා 2019.04.09 දින අමාත්‍ය මණ්ඩලය ලබා දී ඇති තීරණය අනුව කටයුතු කර, පවතින ගොඩනැගිලි බදු දීමෙන් හා යන්ත්‍ර සූත්‍ර විකිණීමෙන් ලැබෙන මුළු මුදල භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලෙස 2019.10.07 දින දැනුම් දී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් දැනුම් දී ඇත. |
| (ii) | බදුල්ල සණස සංගමය වෙත 1992 වර්ෂයේදී ලබා දී තිබූ රු. 11,114,479 ක උප ණය මුදල හා ඒ මත අයවිය යුතු වාර්ෂික සියයට 3 බැගින් වූ පොළීමුදල වන රු.9,002,728ක් වශයෙන් එකතුව රු.20,117,207ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත් වී තිබුණි.උප ණය ගිවිසුම අනුව එකී ණය මුදල 2006 වර්ෂය වන විට ගෙවා අවසන් කල යුතුව පැවති බව එහිදී වැඩිදුරටත් නිරීක්ෂණය විය. | විධිමත් ක්‍රියාමාර්ගයන් මඟින් හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | සණස සංගමය හා සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන (ගැරන්ටි) ලිමිටඩ් වෙත ලබාදී ඇති උපණය අයකර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති මගින් හිමිකම් කැඳවීමේ ලිපියක් (Letter of Demand) යැවීමට නීති කටයුතු දෙපාර්තමේන්තුවට යොමුකර ඇත. |
| (iii) | ලංකා ධීවර සංස්ථාව වෙත අවස්ථා 03 කදී ලබා දුන් රු.116,000,000 ක් වූ උපණය මුදලින්, රු.111,600,000 ක ණය වාරික මුදල් හා ඉන් රු.11,600,000 ක ණය මුදල මත අයවිය යුතු වාර්ෂික සියයට 5 බැගින් වූ පොළී මුදල වන රු.5,220,000 ක් වශයෙන් එකතුව රු.116,820,000 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත් වී තිබුණි. | විධිමත් ක්‍රියාමාර්ගයන් මඟින් හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | සංස්ථාවේ නිලධාරීන් සමඟ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී සංස්ථාවේ අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් ණය පියවීමට හැකියාවක් නොමැති බැවින් අදාළ ණය කපාහරින මෙන් ධීවර සංස්ථාව විසින් ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව ණය මුදල කපාහැරීමට හා පොලිය අත්හැර දැමීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර ඉදිරියේ දී අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් |

| | | | |
|---|---|---|---|
| | | | පසු කපාහැරීමට කටයුතු කරනු ලැබේ. |
| | (iv) සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවා (ගැරන්ටි) ලිමිටඩ් වෙත, Renewable Energy for Rural Economic Development Project (RERED) සඳහා ලබා දී තිබුණු උපණය මුදල 2018 මාර්තු 31 දින වන විට සම්පූර්ණයෙන්ම ගෙවා නිමකල යුතු වුවත්, 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඉන් රු.633,395,760 ක වාරික මුදලක් හා රු.56,973,949 ක පොළී මුදල වශයෙන් එකතුව රු.690,369,709 ක් මෙතෙක් අයකර ගෙනනොතිබුණි. | විධිමත් ක්‍රියාමාර්ගයන් මඟින් හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | සණස සංගමය හා සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන (ගැරන්ටි) ලිමිටඩ් වෙත ලබාදී ඇති උපණය අයකර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති මගින් හිමිකම් කැඳවීමේ ලිපියක් (Letter of Demand) යැවීමට නීති කටයුතු දෙපාර්තමේන්තුවට යොමුකර ඇත. |
| | (v) උපණය ගිවිසුම් 06 ක් යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත ලබා දී තිබුණු උපණය මුදලින්, ගිවිසුම් ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයවිය යුතු රු. 3,041,432,228 ක වාරික මුදල හා ඒ මත අයවිය යුතු පොළිය වන රු.564,229,107 ක් ලෙස එකතුව රු.3,605,661,335 ක් අයකර ගෙන නොතිබුණි. | විධිමත් ක්‍රියාමාර්ගයන් මඟින් හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා මිල්කෝ සමාගම වෙත ලබා දී ඇති උපණයවලින් හිඟව පවතින උපණය එම ආයතනවලට පියවීමේ හැකියාවක් නොමැති බැවින් එම ආයතනවල සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ද එකඟතාව මත එම ආයතන වෙත ලබා දී ඇති ණය මුදල් ප්‍රාග්ධනිත කිරීම මගින් රජයේ ප්‍රාග්ධන දායකත්වය වැඩි කිරීමට හා පොළිය අත්හැර දැමීමට අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට පියවර ගනිමින් පවතී. |
| | (vi) මිල්කෝ ආයතනයේ කර්මාන්ත ශාලා නවීකරණය (1 කොටස) වෙනුවෙන් අදියර 1 හා 2 යටතේ ලබා දී තිබූ උපණය මුදලින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටඅයවිය යුතු රු. 5,476,523,562 ක වාරික මුදල හා ඒ මත අයවිය යුතු පොළිය වන රු.886,412,720 ක් ලෙස එකතුව රු.6,362,936,282 ක් අයකර ගෙන නොතිබුණි. | විධිමත් ක්‍රියාමාර්ගයන් මඟින් හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | එම ආයතනවල සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාව මත ලබා දී ඇති ණය මුදල් ප්‍රාග්ධනිත කිරීම මගින් රජයේ ප්‍රාග්ධන දායකත්වය වැඩි කිරීමට හා පොළිය අත්හැර දැමීමට අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට පියවර ගනිමින් පවතී. |
| (ආ) | සමාගමේ වත්කම් විකුණා ලැබෙන මුදල් භාවිතා කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ මුදල් භාණ්ඩාගාරය වෙත පියවීමේ එකඟතාවය මත, | විධිමත් ක්‍රියාමාර්ගයන් මඟින් හිඟ ණය ශේෂ අයකර ගැනීමට | 2018.05.14 දිනැති අංක MF/PE/02/CM/2018/86 අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2018.05.22 දිනැති |

| | | | |
|---|---|---|---|
| | ගෝල්ඩන් කී තැන්පත්කරුවන් වෙත ගෙවීම සඳහා 2015 වර්ෂයේ සිට ගෙවන ලද රු. 8,189,000,000 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් උපණය ගිවිසුම්වලට එළඹීමට හෝ උපණය ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර, අදාල මුදල් පියවා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | කටයුතු කළ යුතුය. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිදහස් කරන ලද මුදල් පොළී රහිත ණය මුදලක් ලෙස පරිවර්තනය කිරීමටත් ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ඒ සඳහා උපණය ගිවිසුමකට එළඹීමටත් අනුමැතිය ලබා දී තිබූ බැවින් උපණය ගිවිසුම අත්සන් කිරීමේ කටයුතු නිමකර ගිණුම්ගත කිරීම සඳහා භාණ්ඩාගාරයවෙත යොමු කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වරින්වර දන්වා යවනු ලැබුවත් උපණය ගිවිසුමකට එළඹීමේ හැකියාවක් නොමැති බව ශ්‍රී ලංකා මහ බැංකුව දන්වා තිබුණි. උපණය ගිවිසුමකට එළඹීමකින් තොරව උපණය ගිණුම්ගත කිරීමේ හැකියාවක් නොමැති බැවින් උපණය ලෙස මෙම මුදල 2019 වර්ෂයේදී ගිණුම්ගත කර නොමැත.<br><br>ඒ අනුව ඉහත අනුමැතියට අදාළව ගිණුම්ගත කිරීම් සිදුකිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස 2020.03.11 දිනැති ලිපියෙන් සියලු පාර්ශවයන් වෙත දන්වා යවා ඇත. (ඇමුණුම 3) ඒ අනුව උපණය ගිවිසුම්වලට එළැඹීම හෝ උපණය ලෙස ගිණුම්ගත කිරීම තවදුරටත් අවශ්‍ය නොවේ. |
| (ඇ) | 2019 වර්ෂයේ භාණ්ඩාගාර අවසන් ගිණුම් සාරාංශ අනුව වැය විෂයය අංක 2302 (උප ණය ලබාදීම්) යටතේ රු. 12,166,171,721 ක වියදමක් දරා තිබූ අතර රජයේ මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 20 ට අනුව ගිණුම්ගත කර තිබූ උපණය වටිනාකම රු.11,466,171,721 ක් විය. ඒ අනුව අවසන් ගිණුම් සාරාංශ හා මූල්‍ය ප්‍රකාශන අතර ලබා දී ඇති උප ණය මුදල් (On – Lending) වටිනාකමේ රු.700,00,000ක වෙනසක් නිරීක්ෂණයවිය. | විධිමත් ක්‍රියාමාර්ගයන් මඟින් හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉහත පිළිතුර අදාළ වේ. |

## 2.2.2 අසම්භාව්‍ය බැරකම් හා බැදීම්

--------------------------------

**විගණන නිරීක්ෂණය**

2019 දෙසැම්බර් 31 දින වනවිට මහා භාණ්ඩාගාරය විසින් වාණිජ බැංකු 02 ක් හා එක් ආයතනයක් වෙත නිකුත් කරන ලද රු. මිලියන 8,476 ක් වටිනා සහන ලිපි 07 ක් හා එක්සත් ජනපද ඩොලර් මිලියන 75 (රු. මිලියන 13,622.55) ක් වටිනා සහන ලිපි 06 ක් කල් ඉකුත් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| Institution | Date of Expiry | Outstanding Amount 2019-12-31 Capital | |
|---|---|---|---|
| | | USD Mn | Rs. Mn |
| Lanka Sathisa Limited | 2015-08-31 | | 1,238.80 |
| Lanka Sathisa Limited | 2015-04-30 | | 6,547.60 |
| Lanka Sathisa Limited | 2015-07-31 | | |
| Co-operative Wholesale Establishment | 2018-01-11 | | 400.00 |
| Co-operative Wholesale Establishment | 2018-02-22 | | 289.60 |
| Sri Lankan Air Lines Limited | 2019-12-31 | 32.50 | |
| Sri Lankan Air Lines Limited | 2019-12-31 | 32.50 | |
| Mihin Lanka Limited | | 2.50 | |
| Mihin Lanka Limited | | 2.50 | |
| Mihin Lanka Limited | | | 1,650.00 |
| Mihin Lanka Limited | | | 1,650.00 |
| Mihin Lanka Limited | | 2.50 | |
| Mihin Lanka Limited | | 2.50 | |
| | | 75.00 | 8,476.00 |

**නිර්දේශය**

ඇපකර හා සහන ලිපි නිකුත් කිරීම විධිමත් ක්‍රියාමාර්ගයන් යටතේ සිදු කළ යුතුය.

**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**

<u>කල් ඉකුත් වූ භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි</u>

අංක 19/1659/108/147 හා 2019.05.30 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව ලංකා ස.තො.ස. ලිමිටඩ් වෙනුවෙන් නිකුත් කරන ලද පහසුකම් සැලසීමේ ලිපි තුනක් යටතේ ලබාගෙන ඇති ණය මුදල් හා ගෙවීමට ඇති පොලී මුදල්වල එකතුව වන රු. බිලියන 9.8ක මුදල කාලීන ණය මුදලක් බවට පරිවර්තනය කර 11% ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ මහා භාණ්ඩාගාරය විසින් ලංකා බැංකුව හා මහජන බැංකුව වෙත ගෙවීමටත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමටත් 2019.06.25 දින අමාත්‍ය මණ්ඩලය මගින් අනුමැතිය ලබා දී ඇත.

සමූපකාර තොග වෙළඳ සංස්ථාව (ස.තො.ස.) විසින් වී අලෙවි මණ්ඩලයෙන් වී තොග ලබාගැනීම සඳහා නිකුත් කරන ලද රු. මිලියන 880ක පහසුකම් සැලසීමේ ලිපි දෙකක් යටතේ ලබාගෙන ඇති වී තොගවලට අදාළ මුදල් පියවීමට කටයුතු කරන ලෙස සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව හා අදාළ විෂය භාර අමාත්‍යාංශය හා ස.තො.ස. ආයතනය වෙත දැනුම් දී ඇති අතර දැනට ස.තො.ස. ආයතනය සතුව පවතින තොග විකිණීමෙන් හා ලංකා ස.තො.ස. වෙතින් ස.තො.ස. ආයතනය වෙත ලැබිය යුතු මුදල් ලැබූ පසු එම ණය මුදල් පියවන බවට ස.තො.ස. ආයතනය විසින් දැනුම් දී ඇත. මේ වන විට එහි නොපියවූ ශේෂය රු. මිලියන 689.6 දක්වා අඩු වී ඇත.

ශ්‍රී ලංකන් ගුවන් සමාගම වෙනුවෙන් ලංකා බැංකුව හා මහජන බැංකුව වෙත නිකුත් කරන ලද ඇ.ඩො. මිලියන 32.5 බැගින් වූ පහසුකම් සැලසීමේ ලිපි දෙකෙහි වලංගු කාලය 2020.12.31 දක්වා දීර්ඝ කර ඇත.

මිහින් ලංකා සමාගම වෙනුවෙන් ලංකා බැංකුව හා මහජන බැංකුව වෙත නිකුත් කරන ලද පහසුකම් සැලසීමේ ලිපි හයෙහි වලංගු කාලය දීර්ඝ කරන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු දැනට කරමින් පවතී.

### 2.2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නියැදි විගණන පරීක්ෂාවේදි අනාවරනය වු පරිදි,ආයතන 70 කට අයත් වසර ගනනාවක සිට පැවත එන,අත්තිකාරම්"බී" ගිණුම්වල පැවති විශ්‍රාම ගිය, මියගිය, වැඩ තහනම් කල හා සේවය හැරයෑම් වලට අදාල එකතුව රු.602,462,162 ක ශේෂ අය නොවී පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීම විධිමත් කළ යුතුය. | අත්තිකාරම් "බී" ගිණුම් විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව ඉතා ඉහල මට්ටමක පවතින ආයතන 10 ක් පළමු කාණ්ඩය ලෙස තෝරාගෙන ඉන් ආයතන 7 ක් මේ වන විට කැඳවා රැස්වීම් පවත්වා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. ඉතිරි ආයතන 3 ඉදිරියේදී කැඳවීමට කටයුතු කරනු ලැබේ. |